C
891.48309
SAM

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

# සිංහල නවකථාව කෙරෙහි දේශපාලන බලපෑම්
# (1940 - 1980)

1987, ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය (සිංහල) සඳහා
පේරාදෙණිය විශ්වවිද්‍යාලය වෙත
ඉදිරිපත් කළ යුතු නිබන්ධය

විභාග අංකය: එම්.ඒ.233
එස්.එම්.එන්.ආර්.සමරසිංහ

සිංහල දෙපාර්තමේන්තුව
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
පේරාදෙණිය.

1988

414474

## සාරාංශය

දේශපාලන හා සමාජමය විපර්යාසයන්ගේ බලපෑමට ලක් වූ සිංහල නවකථා පිළිබඳ ව අධ්‍යයනයක් මෙ මගින් කෙරේ. අධ්‍යයනයේ පහසුව සඳහා කාලසීමාව 1940-1980 අතරට පමණක් සීමා කෙරේ. එහෙත් මුල්කාලීන කෘති කෙරෙහි ද අවධානයක් යොමු කරන්නට අවශ්‍ය විය.

අධ්‍යයනය සාර්ථක ව කර ගැනීම සඳහා දේශපාලන අදහස් ඇතුළත් නවකථාව පිළිබඳ ව විශ්ව සාහිත්‍යයේ මෙන් ම සිංහල සාහිත්‍යයේ ප්‍රභූ යැ යි සම්මතය ලත් පිරිසෙන් අතළොස්සක් දෙනාගේ අදහස් පිළිබඳ ව සුළු හැඳින්වීමක් කර ඇත. අනතුරුව අයිසැක් ද සිල්වාගේ පටන් මාර්ටින් වික්‍රමසිංහ තෙක් කතුවරුන් ගේ මුල්කාලීන කෘතිවල දේශපාලන අදහස් ඇතුළත් වන්නේ කෙසේ දැ යි පෙන්වා දෙන අතර, 1940න් පසුව 1980 කාල පරිච්ඡේදය තෙක් විවිධ සමාජ හා දේශපාලන විපර්යාසයන් නවකථාවෙන් පිළිබිඹු කෙරෙන අයුරු විග්‍රහ කෙරේ.

1940-1980 අතර සමාජ විපර්යාස තුනක් නවකථාවට බලපා ඇති බව පෙන්වා දී තිබේ. පළමුවැන්න මාක්ස්වාදයේ බලපෑමත්, දෙවැන්න 1956 සමාජ විපර්යාසයේ බලපෑමත්, තුන්වැන්න විප්ලවවාදී ව්‍යාපාරයේ බලපෑමත් ය. මෙම බලපෑම් ලබන නවකථාවලින් ඇතැම් කෘති වාර්තා ස්වරූපයක් ගන්නා අතර, කලාත්මක ලක්ෂණ ඇතුළත් කෘති ද වේ. මේවායින් කෙරෙන සාමාජික බලපෑම අල්ප ය. එයට හේතුව විවිධ ජන සන්නිවේදන රාශියක් නවකථාවේ සමාජ කාර්යයට ආදේශ වීම බව පෙනේ. එසේ වුව ද වර්තමානයේ බිහි වෙන නවකථා වලට අනුව කලා කෘතියක් වශයෙන් එහි අගයේ පිරිහීමක් දක්නට නැති බව ද මෙයින් පැහැදිලි කෙරේ.